**ශීර්ෂය 257 - කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

ශීර්ෂය 257 - කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා , පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ජුනි 12 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය හා ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම.**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 1,072.00 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 1017.74 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 54.26 ක් හෙවත් සියයට 5.06 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 834.00 | 832.62 | 1.38 | 0.17 |
| මූලධන | 238.00 | 185.12 | 52.88 | 22.22 |
| **එකතුව** | **1,072.00** | **1,017.74** | **54.26** | **5.06** |

(ආ) **අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය කිරීම**

විවිධ කාර්යයන් සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත අමාත්‍යාංශ 26 ක් හා දෙපාර්තමේන්තු 15 ක් විසින් එකතුව රු.මිලියන 3,268.52 ක ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 3,126.02 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සලසා තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 142.50 ක් හෙවත් සියයට 4 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි.

**2.2. රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ විෂය අංක 25701 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** |
| 80.00 | 79.91 | 55.00 | 63.72 | 265.00 | 213.84 |

**2.3 පොදු තැන්පත් ගිණුම්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වන තැන්පත් ගිණුම් 06 ක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 353.28 ක් විය. විස්තර පහත දැක්වේ.

| **තැන්පත් ගිණුම් අංකය** | **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | **රු.මිලියන** |
| 6000/0000/00/0001/0059/000 | 0.89 |
| 6000/0000/00/0002/0077/000 | 20.19 |
| 6000/0000/00/0016/0030/000 | 183.46 |
| 6000/0000/00/0017/0008/000 | 39.74 |
| 6000/0000/00/0018/0037/000 | 97.09 |
| 6000/0000/00/0019/0006/000 | 11.91 |
| **එකතුව** | **353.28** |

**2.4 විගණන නිරීක්ෂණය**

කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

---

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

---

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඒ යටතේ වූ සමහර ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | **ලේඛන වර්ගය** | **අදාළ රෙගුලාසිය** | **නිරීක්ෂණ** |
|---|---|---|---|
| (i) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 නොවැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි. |
| (ii) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/ 2002/2 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ලේඛන පවත්වා නොතිබුණි. |
| (iii) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා කළුතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පවත්වා නොතිබුණි. |

.

### 3.2 පොදු තැන්පත් ගිණුම්

---

වර්ෂ 2 ඉක්මවූ එකතුව රු.9,064,783 ක්වූ තැන්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

### 3.3 රජයේ නිළධාරින්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

---

විෂය අංක 25701 දරන රජයේ නිළධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.204,121 ක්වූ අතර එම හිඟ හිටි ශේෂ වර්ෂ 1 ක සිට වර්ෂ 5 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟ හිටි ණය ශේෂ අයකර ගැනීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අපොහොසත් වී තිබුණි.

### 3.4 වත්කම් කළමනාකරණය

---

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රිය හා ඌන උපයෝජන වත්කම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) හොරණ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාල පරාසය තුළ රු.1,476,706 ක් වැයකර ඉදිකර තිබූ පහළ මිල්ලැව දකුණ ග්‍රාම ලේකම් කාර්යාලය භාවිතයට ගෙන නොතිබුණි.

(ii) හොරණ නගරයේ 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වූ කාල පරාසයක කාලය තුළ රු.6,883,222 ක් වැය කර ඉදිකර තිබූ රාජ්‍ය ඔසුසල ගොඩනැගිල්ල නියමිත ප්‍රමිතියට අනුකූලව ඉදිකර නොතිබූ බැවින් ව්‍යාපාරික කටයුතු සඳහා භාවිතයට ගෙන නොතිබුණි.

(iii) කළුතර දිස්ත්‍රික්කයේ 1994 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා කාල පරාසය තුළ වසා දමා තිබූ පාසල් 46 ක් අතරින් පාසල් 15 කට අයිතිව තිබූ ඉඩම් අක්කර 38 ක් සහ පාසල් ගොඩනැගිලි 15 ක් භාවිතා නොකර අතහැර තිබුණි.

(iv) දොඩංගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිශ්‍රයේ රු.4,969,625 ක් වැයකර ඉදිකර තිබූ ආපනශාලා ගොඩනැගිල්ල 2017 ජුනි මාසය වන විටත් ව්‍යාපාරික කටයුතු සඳහා ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

**3.5 පාඩු හා හානි**

1989 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා කාලය තුළ විෂයයන් 04 කට සිදුවී තිබුණු එකතුව රු.2,476,817 ක්වූ අලාභ හානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.

**3.6 කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මහජන කටයුත්තක් සඳහා ඉඩම් අත්පත් කර ගැනිම සඳහා වන නිවේදනය ගැසට් පත්‍රයේ පල කළ යුතු වුවත්, හොරණ ප්‍රාදේශීය ලේකම් විසින් ඉඩම් කැබලි 7 ක් අත්පත් කර ගැනිම සඳහා අදාළ නිවේදනය ගැසට් පත්‍රය පල කර නොතිබුණි. එමෙන්ම එම ඉඩම් කැබැලිවල වටිනාකම පිළිබඳව තක්සේරු වාර්තාවක් ලබා ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂයේදී රු.9,896,915 ක් වන්දි වශයෙන් ගෙවා තිබීම.

(ආ) හොරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පස් කැපීම හා ප්‍රවාහනය සඳහා 2016 වර්ෂයේදී ලබා දී තිබුණු බලපත්‍රවලින් එක් බලපත්‍රයකින් පස් කියුබ් 2 ක් පමණක් ප්‍රවාහනය කළයුතු වුවත්, ඊට වඩා වැඩි ප්‍රමාණයක් ප්‍රවාහනය කර තිබූ අවස්ථා නිරීක්ෂණය විය.

(ඇ) හොරණ සතිපොල 2014 හා 2015 වර්ෂවල සංවර්ධනය කිරීමේදී නාගරික සංවර්ධන අධිකාරියට පස් ඝන මීටර් 24149 ක් සැපයීම වෙනුවෙන් රු.22,483,500 ක් වැඩිපුර ගෙවා තිබුණි.

**3.7** **මානව සම්පත් කළමනාකරණය**

**--------------------------------**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**---------------------------------------------------**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 75 | 74 | 4 | 03 |
| (ii) | තෘතීයික මට්ටම | 56 | 34 | 22 | -- |
| (iii) | ද්විතියික මට්ටම | 2,423 | 1,965 | 464 | 06 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 167 | 146 | 22 | 01 |
| | **එකතුව** | **2,721** | **2,219** | **512** | **10** |

- ද්විතීයික මට්ටමේ සේවක පුරප්පාඩු 464 අතරින් 86 දෙනෙකු ග්‍රාම නිලධාරීන්ද 303 දෙනෙකු සංවර්ධන නිලධාරීන්ද විය.